# ගෙවත්ත සැළසුම් කිරීම සඳහා මගපෙන්වීම

## අරමුණ

Covid-19 වසංගතයත් සමග ඉදිරියේදී ඇතිවිය හැකි එළවළු ඇතුළු ආහාර හිඟයට මුහුණ දීම සඳහා සිය නිවාස අවට වටපිටාව උපරිම ප්‍රයෝජනයට ගතහැකි වන සේ ගෙවත්ත සැළසුම් කිරීම ප්‍රධාන අරමුණ වේ.

නිවෙස්වලට වී සිටීමට ඇති කාලයේ මෙවන් දෙයකට යොමුවීම තුලින් මානසික සහනයක් ද ඇතිවන අතර එය ශාරීරික සුවතාවයට ද හේතුවක් වනු ඇත.

## සැළසුම්කරණයේ මූලික පියවර

1. ගෙවත්තේ පවතින තත්ත්වය හඳුනාගන්න.
    - **භූමියේ ස්වභාවය** - බෑවුම, ඉඩමේ පිහිටීම හා හැඩය.
    - **පසේ ස්වභාවය** - මැටි අධික පස, වැලි පස, පසේ සාරවත් බව, සෝදාපාළුවට ලක්වී තිබීම. ජලය රැඳෙන ස්ථාන, ගල් සහිත ස්ථාන, බොරළු ස්ථර පිහිටා තිබීම වැනි.
    - **ගෙවත්තේ සීමාවන්** - වැට ඇති නැති බව, තාප්ප පිහිටා ඇති ආකාරය.
    - නිවස හා අනෙකුත් ගොඩනැගිලි වල පිහිටීම.
    - ගෙවත්තට හිරු එළිය ලැබෙන ආකාරය හා දිශාව.
    - ජල සැපයුම - වර්ෂාපෝෂිත, වාරි ජල පහසුකම.
    - **පවතින බෝග, ඒවායේ තත්ත්වය හා ඵලදායීතාව** - අඩු අස්වැන්න හෝ අස්වනු ලබා නොදීම, කණාටු වූ ශාක, කප්පාදු කිරීම අවශ්‍ය ශාක.
2. මේ සඳහා ගෙවත්තේ විවිධ කලාප හඳුනාගන්න. (සෙවන සහිත, දිය සීරාව සහිත, හොඳින් හිරුඑළිය වැටෙන වැනි) එක් එක් කලාප විවිධ ක්‍රම මගින් වෙන් කිරීම තුළින් ගෙවත්තේ අලංකරණය වැඩි වේ.
3. තීරණය කරගත් අංග හා බෝගයන් දක්වෙන ලෙසින් දළ සැළසුමක් ඇඳගන්න.

## සැළකිය යුතුයි

ගෙවතු වගාවේදී නිර්දේශිත පරතර අනුගමනය නොකළ ද බෝගය සඳහා ප්‍රමාණවත් පරිදි පරතර තබාගත යුතුය.

## අවධානය යොමුකළ යුතු තාක්ෂණික කරුණු

### බෝග තෝරාගැනීම

පෝෂණීය ආහාර වේලකට අවශ්‍ය ද්‍රව්‍ය හැකි පමණ එක්කරගත හැකි වන සේ එළවළු, පලතුරු, පලා වර්ග, අල බෝග වැනි බෝග කාණ්ඩ වලින් බෝග තෝරා ගන්න.

**එළවළු :**

මෑ, බටු, එලබටු, තිබ්බටු, බෝංචි, මිරිස්, මාලු මිරිස්, අතු ගෝවා, මල් ගෝවා, ගෙඩි ගෝවා, කරවිල, රාබු, නෝකෝල්, දඹල, වැටකොළු, පතෝල, තක්කාලි, බණ්ඩක්කා (විශේෂයෙන් පවුලේ රුචියට අනුව තෝරාගත යුතුය)

**පලා වර්ග :**

ගොටුකොළ, මුකුණුවැන්න, තම්පලා, සාරණ, නිවිති, කතුරුමුරුංගා, මුරුංගා, කළුකම්බේරිය, කෝවක්කා, කිරි අඟුන, තෙබු, කංකුන්, පොල්පලා, අසමෝදගම් (පවුලේ රුචියට අනුව තෝරා ගන්න)

**කුළුබඩු හා ඖෂධ :**

කරපිංචා, රම්පෙ, සේර, ඉඟුරු, කහ

**පලතුරු :**

අඹ, පැපොල්, දොඩම්, දෙහි, පැෂන්ෆෲට්, පේර, කොමඩු, උක්, දෙළුම්, කෙසෙල් (ඉඩ ප්‍රමාණය හා පවුලේ රුචියට අනුව තෝරා ගන්න)

**අල වර්ග :**


මඤ්ඤොක්කා, බතල, වැල් අල වර්ග, කිරි අල (පවුලේ රුචියට අනුව තෝරා ගන්න)

**වෙනත් බෝග :**

බඩඉරිඟු, ඉදල් ඉරිඟු, පැණි ඉරිඟු (Sweet corn)

### පැළ සකස් කරගැනීම හා රෝපණය සඳහා බඳුන්

- තවාන් දැමීම සහ පැළ රෝපණය සඳහා විවිධ බඳුන් යොදාගත හැකිය. උදා : මල් පෝච්චි, හාල් බෑග්, කිරිපිටි කවර, පොල් කටු, වෙනත් ප්ලාස්ටික් භාජන, අයිස්ක්‍රීම් පෙට්ටි, පැලූ කිතුල් කොට.
- මතුපිට පස් හා කාබනික පොහොර (ගොම හෝ වියළි කොම්පෝස්ට් පොහොර) 1 : 1 අනුපාතයට මැනවින් මිශ්‍ර කොට බඳුන් පිරවීම සඳහා යොදාගත යුතුය.
- ඒ සෑම භාජනයකම ජලය හොඳින් බැස යාම සඳහා පතුලේ සිදුරු සෑදිය යුතුය.




### කුඩා බීජ තවාන් කිරීම

සියුම්ව සකසාගත් ඉහත මිශ්‍රණයම සුදුසු වේ. තෝරාගත් බඳුනේ ඉහළ සිට සෙන්ටිමීටර් 4 - 5 ක් පමණ ඉතිරි වන සේ බඳුන් මිශ්‍රණයෙන් පුරවා බීජ තැම්පත් කර ඊට උඩින් සියුම් පස් සෙන්ටිමීටර් 1 - 2 ක් ඝණකමට යොදන්න. බීජ පැළ වන තුරු තෙතමනය පවත්වාගත යුතුය.

# ගෙවත්ත සංවර්ධනය සඳහා උපාය මාර්ග

## ගෙවත්තේ පවතින බහුවාර්ශික ශාක ඇති ස්ථාන සඳහා

- එම ශාක වල අනවශ්‍ය අතු ඉවත් කර දමන්න.
- සෙවණ ප්‍රිය කරන ශාක ඒ වටා වවන්න.

  උදා : ගොටුකොළ, කිරි අල

## නිසරු හෝ ගල් සහිත ස්ථාන සඳහා

- වගා බඳුන්, ප්ලාස්ටික් පෝච්චි හෝ ඉවත් කළ හාල් බෑග්.
- මිරිස්, මාළුමිරිස්, බටු වැනි එළවළු, රාබු, බීට් වැනි අල වර්ග.

## දිය සීරාව සහිත ස්ථාන/ නිවසේ අප ජලය යන ස්ථාන

- කොහිළ, මුකුණුවැන්න, කංකුන් වැනි ජලය ප්‍රිය කරන ශාක.

## හොඳින් හිරුඑළිය වැටෙන ස්ථාන

- ගෙඩි හෝ කරල් හටගන්නා එළවළු හෝ පළතුරු.

  උදා : තක්කාලි, බටු, මිරිස්. මෑකරල්, කොමඩු

## වැට සඳහා

- වැල් බෝග වැවීමට කටයුතු කරන්න.
- කරවිල, වැටකොළු, හෝ වැට සඳහා කතුරුමුරුංගා, මුරුංගා කෝටු සිටුවන්න.

## කොන්ක්‍රීට් වහලවල් (ස්ලැබ්) සඳහා

- වගා මළු, පෝච්චි, වගා කුළුණු භාවිතයෙන් වගාව සඳහා යොමුවිය හැකිය.

## ඉඩකඩ අවම ස්ථාන වලදී

- සිරස් වගා කුළුණු වෙත යොමුවීමෙන් වගා කළ හැකි ඉඩකඩ වැඩිකරගත හැකිය.



වගා කුළුණ

## සැළකිලිමත් වන්න

- පවුලේ ශ්‍රමය යොදාගැනීමේ හැකියාව හා රුචිය අනුව බෝග වගා රටාවන් පිළියෙල කරගන්න.
- කොම්පෝස්ට් පොහොර සකසාගැනීමේ ක්‍රමයක් ගෙවත්තට අත්‍යාවශ්‍ය අංගයකි.
- මී මැසි පාලනය, කුඩා සත්ත්ව පාලන ඒකක ඇතිකරගැනීම තුළින් ගෙවත්ත වඩාත් ඵලදායී කරගත හැකි වනු ඇත.

**පළිබෝධ පාලනය ඇතුළු වැඩිදුර උපදෙස් සඳහා**

ඔබේ ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයා හෝ
කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයා හෝ
"1920" කෘෂි උපදේශන සේවය අමතන්න.

සැකසුම
හසිත කීර්තිරත්න
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)
කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නෝරුව

නිර්මාණය හා මුද්‍රණය
කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නෝරුව

# සෞභාග්‍ය ගෙවත්ත

## සැළසුම් කිරීම සඳහා මගපෙන්වීම



**මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**